**යටියන්තොට ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.953,413ක කර්මාන්ත සඳහා ගිවිසුම්ගත වී නොතිබිය දී ඊට ණයහිමි වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේ දී ගිවිසුම්ගත වී තිබුණු නමුත් 2023 වර්ෂයට අවිච්ඡේද නොකළ කර්මාන්තයකට හා 2023 වර්ෂයේදී රැඳවුම් මුදල් ද ගෙවූ රු.1,167,217 ක් වටිනා කර්මාන්ත 02 ක් සඳහා කර්මාන්ත ණයහිමි හා ණයගැති ලෙස වෙන්කිරීම් සිදුකර තිබුණි. | නිවැරදි කරන බව. | - එම - |
| (ඇ) | රු.283,340ක මූලධන ස්වරූපයේ වියදම්, පුනරාවර්තන වියදම් ලෙස කපා හැර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවන ආකාරයට කටයුතු කරන බව. | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 294,348,584 ක් වූ ගිණුම් විෂයයන් 06ක් වෙනුවෙන් ලේඛන ඉදිරිපත්කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිදෙර්ශය** |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 20 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(අ) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් අදාළ කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත්, අවස්ථා 05ක දී රු.55,467ක් දින 04ත් හා දින 29ත් අතර කාල පමාවකින් ද, බිල්පත්වලින් පියවීම් අවස්ථා 18ක දී රු.421,224ක් දින 14ත් දින 40ත් අතර කාල පමාවකින් ද යුතු ව පියවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අංක 2235/54 හා 2021 ජූලි 08 දිනැති ගැසට් පත්‍රයේ රාජ්‍ය සභාවේ 1978 අංක 48 දරන නාගරික සංවර්ධන පනතේ 83(1) වගන්තිය | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලද අනුමත අයදුම්පත් 67 න් අයදුම්පත් 44 ක් සඳහා, අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. එය ලද අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 65 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2010 මාර්තු 24 දිනැති අංක 08/2010 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහය | සභාවට අයත් අක්කර 06ක පැවැති සුසාන භූමි 07ක්, සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත්කර නොතිබුණු අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට හා මායිම් ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබිණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,889,217 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 17,784,468 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත්කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල්කල ආදායම රු. | රැස්කල ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල්කල ආදායම රු. | රැස්කල ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 4,598,013 | 5,159,810 | 5,467,151 | 897,194 | 4,306,642 | 4,475,968 | 4,262,495 | 1,204,536 |
| (ii) | කුලී | 10,096,800 | 11,336,148 | 11,209,228 | 191,307 | 8,479,900 | 7,874,817 | 8,417,067 | 153,951 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 850,020 | 1,162,116 | 1,162,116 | - | 850,050 | 957,409 | 967,009 | - |
| (iv) | වෙනත් ආදායම් | 2,550,000 | 9,149,671 | 9,952,665 | 932,617 | 5,139,700 | 8,413,354 | 7,458,054 | 1,204,735 |
| | | 18,094,833 | 26,807,745 | 27,791,161 | 2,021,118 | 18,776,292 | 21,721,548 | 21,104,625 | 2,563,222 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු රු.600,147ක වත්කම්, ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කළ යුතු වේ. |
| (ආ) | බැකෝ යන්ත්‍රය අක්‍රියව පැවති කාලය සඳහා අභාවිත සහතිකයක් ලබා නොගැනීම නිසා ආදායම් බලපත්‍ර හා රක්ෂණ ගාස්තු ලෙස රු.143,704ක් ගෙවා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අක්‍රියව පැවති කාලය සඳහා අභාවිත සහතිකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු කටයුතු සඳහා ලද හෙක්ටයාර් 0.404 ක ඉඩමේ අනවසර ඉදිකිරීම් හා වගා සිදුකර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනවසර ඉදිකිරීම් වැළැක්විය යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අනතුරුදායක ගස් කපා ඉවත් කිරීමට ලද අයදුම්පත් 188 කින් විසඳුම් ලබා දී නොමැති සංඛ්‍යාව 136 ක් වූයෙන් එය ප්‍රතිශතයක් ලෙස සියයට 72ක ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනතුරුදායක ගස් ඉවත් කිරීමට ලද අයදුම්පත් පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තනතුරු 09 ක පුරප්පාඩු 20 ක් 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයක සිට පවතී. එමෙන්ම, වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා සේවා ගිවිසුම් මත 12 දෙනෙකු බඳවාගෙන තිබුණි. | සේවා ගිවිසුම් මත සේවකයින් 12 ක් පුරප්පාඩු තනතුර සඳහා බඳවාගෙන ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සෞඛ්‍ය කම්කරු පුරප්පාඩු 05ක් සඳහා සේවා ගිවිසුම් මත බඳවාගෙන තිබූ අතර, එහි ස්ථිර සේවකයින් දෙදෙනෙකු රියදුරු රාජකාරිය සඳහා යොදවා තිබුණි. | බඳවා ගැනීමේ අරමුණට බාධාවක් ඇති නොවන පරිදි සේවයේ යොදවා ගන්නා බව. | - එම - |
| (ඇ) | ඖෂධ සංයෝජක තනතුරකට 2023 දෙසැම්බර් සිට අයෙකු පත් කර තිබුණ ද, ඖෂධ සංයෝජක තනතුරට අදාළ පුහුණුවීම් කිසිවක් ඔහු වෙත ලබා දී නොතිබුණි. ඔහු සතු සුදුසුකම් වූයේ, රියදුරු | ආයුර්වේද බෙහෙත් ශාලාවේ රාජකාරී සම්බන්ධ පුහුණුව සඳහා යොදවමින් ට්‍රැක්ටර් රථ ධාවනය කටයුතු | සුදුසුකම් නොමැති අය වෙත රාජකාරී නොපැවරිය යුතු අතර බඳවා ගත් අය |

| | | | |
|---|---|---|---|
| | බලපත්‍රයක් හා අ.පො.ස (සාමාන්‍ය පෙළ) චිත්‍ර විෂය පමණක් සමත් වී තිබීම පමණි. | සහ පුරප්පාඩුව පවතින මුර සේවයේ කටයුතු සඳහා අවශ්‍යතාව මත යොදවා ගන්නා බව. | නියමිත කාර්යයන්හි පිහිටවිය යුතු වේ. |
| (ඈ) | වර්ෂ 1985 - 2014 අතර කාලය තුළ සේවය කළ සේවකයින් 25 දෙනෙකුගෙන් හිඟහිටි රු.112,607ක ණය ශේෂයක් 2023 වර්ෂය අවසාන වනවිටත් අයකර නොතිබුණි. | දිස්ත්‍රික් විගණන කළමනාකරණ කමිටු තීරණය අනුව කටයුතු කරන බව. | හිඟ ණය අයකර ගත යුතු වේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,298,000 ක වූ වාහන 02 ක් පවරා ගෙන නොතිබුණි. | ට්‍රැක්ටරය සහ ටේලරය පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතු වේ. |
| (ආ) | සභාව සතු රු.4,607,500 ක් වූ වාහන 07 ක් හා ජල බවුසරයක් වසර 02 සිට වසර 14 දක්වා කාලයක සිට අක්‍රීයව පවතින නමුත්, ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | කමිටුවක් මගින් අපහරණය කළයුතු හා අළුත්වැඩියා කළයුතු වාහන හඳුනා ගෙන ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | අක්‍රිය වාහන අපහරණය හෝ අළුත්වැඩියා කළ යුතු වේ. |
| (ඇ) | 2017 අගෝස්තු 16 දිනැති 04/2017 දරන සබරගමු පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව ඉඩම් හා ගොඩනැගිලි සඳහා රජයේ තක්සේරුව ලබා ගැනීම වෙනුවට සභාපති හා ලේකම් ඇතුළු කමිටුවක් මඟින් සිදුකළ තක්සේරුව පදනම් කරගෙන ඉඩම් 07ක් හා ගොඩනැගිලි 20ක් සඳහා රු.120,381,900ක වටිනාකමක් ගිණුම් ගත කර තිබුණි. | රජයේ තක්සේරුව ලබා ගෙන ගිණුම්ගත කරන බව. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |